# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි අවසාන වසර (පුනර්) පරීක්ෂණය - 2018/2019

**<u>තබ්ලා ඉතිහාසය</u>**

**<u>MUNI 43014</u>**

කාලය :- පැ 03

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට <u>(05)</u> පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.

---

1 මෑත කාලයේ දී භාරතයේ උසස් ශිල්පීයත්වයක් දක්වන පහත සඳහන් භාරතීය තබ්ලා වදන ශිල්පීන් අතුරින් දෙදෙනෙකුගේ ජීවන තොරතුරු සැකෙවින් දක්වා ඔවුන්ගේ වාදන කෞශල්‍යය පිළිබඳ විචාරයක යෙදෙන්න.
   උස්තාද් සකීර් හුසේන්
   පණ්ඩිත් අනින්දෝ චැටර්ජී
   පණ්ඩිත් ස්වපන් චෞදරි

2 භාරතීය ශාස්ත්‍රීය සංගීත ක්ෂේත්‍රයෙහි තබ්ලාවට හිමි ස්ථානය පිළිබඳ පුළුල් විග්‍රහයක් යෙදෙන්න.

3 ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රය තුල අවනද්ධ භාණ්ඩ භාවිත වන ක්ෂේත්‍ර පැහැදිලි කරමින් ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයෙහි අවනද්ධ භාණ්ඩයට හිමි ස්ථානය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

4 තබ්ලාවේ ප්‍රභවය පිළිබඳ දැනට ඉදිරිපත් වී ඇති මත සැකෙවින් විස්තර කර එම මතවල සාධාරණීයත්වය පිළිබඳ අදහස් දක්වන්න.

5 "වර්තමාන තබ්ලා ශාස්ත්‍රය හා ශිල්පය ප්‍රධාන වාදන ශෛලි හයක පෝෂණයෙන් පරිපූර්ණත්වයට පත් වී ඇත". ඉහත ප්‍රකාශය අවධාරණය කරමින් තබ්ලාවේ භාරතීය ව්‍යාප්තිය පිළිබඳ විමසුමක යෙදෙන්න.

6 විධිමත් තබ්ලා අධ්‍යාපනයක් ශ්‍රී ලංකාව තුල දී ආරම්භ වූයේ පනහ දශකය අග භාගයේ දී ය. එම ඇරඹුමෙන් පසු වර්තමානය දක්වා ශ්‍රී ලාංකේය තබ්ලා අධ්‍යාපනයේ විකාශය විමසුමට ලක් කරන්න.

7 තබ්ලාවක ධ්වනිය කෙරෙහි බලපාන කොටස් හඳුනාගනිමින් උසස් ධ්වනියක් උත්පාදන වන්නා වූ තබ්ලාවක් නිෂ්පාදනය කිරීමේ දී උක්ත කොටස් කිනම් ප්‍රමිතියකට සකස් වියයුතු දැයි පහදන්න.

::::::::::::::::::::::::::::::::

2021.10.11